# 44 페인트 작업을 했거든요

## තීන්ත ආලේප කරන වැඩය කළා

**학습 안내**
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

| | |
|---|---|
| ▫ අධ්‍යයන අරමුණු | සේවා ස්ථානයේ පරිසරය විස්තර කිරීම/ අස්කරන ආකාරය පැවසීම |
| ▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් | –거든요, –아지다/어지다 |
| ▫ වචන භාවිතය සඳහා උපදෙස් | සේවා ස්ථානයේ පරිසරය, අපද්‍රව්‍ය හා අස්කරන උපකරණ |
| ▫ සංස්කෘතික තොරතුරු | වැඩට ගන්නා උපකරණ පිළිවෙලට තැබීම |

## 대화 1 සංවාදය 1

Track 136



තුඅන් මහතා හා රිහන් මහතා කුමක් පිළිබඳව කතාකරනවද කියා හොඳින් අසන්න. ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

**투안** 어, 리한 씨, 무슨 냄새 나지 않아요? 작업장도 아주 엉망이고요.
ඕ, රිහන් මහතා ගඳක් එන්නේ නැද්ද? වැඩ කරන ස්ථානයත් හොඳටම අවුල්වෙලා.

**리한** 어제 늦게까지 페인트 작업을 했거든요. 너무 늦어서 정리를 하나도 못하고 퇴근했어요.
ඊයේ රෑ වෙනතුරු තීන්ත ගෑවා. ගොඩක් ප්‍රමාද වූ නිසා අස්කරන්නේ නැතිව ගෙදර ගියා.

**투안** 일 시작하기 전에 환풍기 돌려서 환기부터 해야겠어요. 리한 씨는 작업 도구 먼저 정리해 주세요. 작업 도구는 쓰고 나서 바로바로 정리해야 해요. 안 그러면 나중에 못 쓸 수도 있거든요.
වැඩ පටන්ගන්න කලින් ෆෑන් එක ක්‍රියාත්මක කරවල වාතාශ්‍රය ලබාදෙන්න ඕනේ. රිහන් මහතා වැඩට ගන්නා උපකරණ පිළිවෙලට තබන්න. වැඩට ගන්නා උපකරණ භාවිතා කලපසු ඉක්මනට පිළිවෙලට තබන්න ඕනේ. නැත්නම් පසුව භාවිතා කරන්න බැරිවෙන්න පුළුවන්.

**리한** 네, 제가 얼른 치울게요.
ඔව්, මම ඉක්මනට අස් කරන්නම්.

> **하나도 එකක්වත්**
> අනියමාර්ථයෙන් භාවිතා වන අතර 전혀 හෝ 조금도 වැනි තේරුමක් දෙයි.
> · 점심을 못 먹었는데 배가 하나도 안 고파요.
> දවල් කෑම කෑවේ නැති වුනත් බඩගිනි නැහැ.
> · 한국어는 조금 할 수 있지만 일본어는 하나도 못해요.
> කොරියන් භාෂාව ටිකක් කතාකරන්න පුළුවන් වුනත් ජපන් භාෂාව කොහොමවත්ම කතාකරන්න බැහැ.

> **바로바로 එවලෙම**
> · 할 일이 있으면 바로바로 하는 것이 좋다.
> කරන්න වැඩ තිබෙනවානම් එවලෙම කරන එක හොඳයි.
> · 무슨 일이 있으면 바로 바로 알려 주세요.
> ප්‍රශ්නයක් තිබෙනවානම් එවලෙම කියන්න.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 작업장에 나는 냄새는 무슨 냄새예요? වැඩ කරන ස්ථානයේ හමන දුර්ගන්ධය කුමක්ද?
2. 리한 씨는 먼저 무슨 일을 할 거예요? රිහන් මහතා මුලින්ම කුමක්ද කරන්නේ?


정답 1. 페인트 냄새예요. 2. 작업 도구를 정리할 거예요.





## 어휘 1 වචන මාලාව 1　작업장 환경 වැඩ කරන ස්ථානයේ පරිසරය



වැඩ කරන ස්ථානයේ පරිසරය විස්තර කරන කුමන වචන තිබේදැයි සොයා බලමුද?


더럽다
අපිරිසිදුයි


깨끗하다
පිරිසිදුයි


엉망이다
අපිළිවෙලයි


정리가 잘 되어 있다
පිළිවෙලයි


냄새가 심하다
ගඳයි



소음이 심하다
ශබ්දය වැඩියි



쾌적하다
ප්‍රියමනාපය


버리다
විසිකරනවා


치우다
ඉවත් කරනවා


정리하다
පිළියෙළ කරනවා


환기하다
වාතාශ්‍රය ලබාගන්නවා



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සාහ කරන්න.

1. 빈칸에 맞는 표현을 〈보기〉에서 골라 문장을 완성하세요.
හිස්තැනට ගැලපෙන වචනය උදාහරණ වලින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.




보기
치우다
환기하다
버리다
정리하다

1) 쓰레기를 ____________.　2) 페인트 통을 ____________.

3) 작업 도구를 ____________.　4) 창문을 열고 ____________.

정답 1) 버려요 2) 치워요 3) 정리해요 4) 환기해요

## 문법 1 සංවාදය 1 -거든요

G44-1

ක්‍රියා පද සහ විශේෂණ පද සමග සම්බන්ධ කර හෝ 'නාම පදය + 이다' ව්‍යුහය සමග යොදා ගනිමින් ඉදිරිපස අන්තර්ගතය පිළිබඳ හේතුව දැක්වීමේදී භාවිතා වේ.

| 동사 (ක්‍රියාපදය) | 형용사 (නාම විශේෂණ පදය) | 명사 (නාමපදය) | |
|---|---|---|---|
| **-거든요** | **-거든요** | 자음(ව්‍යඤ්ජනය) → **이거든요** | 모음(ස්වරය) → **거든요** |
| 자다 → 자**거든요**<br>울다 → 울**거든요** | 싸다 → 싸**거든요**<br>좋다 → 좋**거든요** | 학생 → 학생**이거든요**<br>휴가 → 휴가**거든요** | |

- 가: 작업장이 정말 깨끗하네요. සේවා ස්ථානය සැබැවින්ම පිරිසිදුයිනේ.
  나: 오전에 청소를 **했거든요**. උදේ කාලයේ පිරිසිදු කළ නිසානේ.
- 가: 내일부터 일주일 동안 쉬어요? හෙට ඉඳලා සතියක් පුරාවට විවේක ගන්නවද?
  나: 네, **여름휴가거든요**. ඔව්, ගිම්හාන නිවාඩුව නිසා.



'-거든요' අවබෝධ වුනාද? එසේනම් හිස්තැනට ගැලපෙන වචනය ලියා දෙබස සම්පූර්ණ කරන්න.

2. 그림을 보고 '-거든요'를 사용해서 대화를 완성하세요.
පින්තූරය දෙස බලා '-거든요' භාවිතාකර දෙබස සම්පූර්ණ කරන්න.

1) 

가: 작업장이 아주 깨끗하네요. වැඩපොළ හරිම පිරිසිදුයිනේ.
나: 그렇죠? 어제 ____________________.
ඒක තමා නේද? ඊයේ පිරිසිදු කලා නේ.

2) 

가: 밖이 왜 이렇게 시끄러워요? ඇයි එළියේ මෙතරම් ශබ්දය?
나: 지금 ____________________.
දැන් ඉදිකිරීමක් කරමින් සිටිනවා නේ.

정답 1) 청소했거든요 2) 공사를 하고 있거든요



තව ටිකක් ඉගෙනගෙන බලමුද? '-거든요' භාවිතාකර උදාහරණයේ දැක්වෙන ආකාරයට වාක්‍ය සම්පූර්ණ කරන්න.


1. 시장에서 장을 봤어요. 시장이 물건 값이 ____________________.
පොළෙන් භාණ්ඩ මිලදී ගත්තා. පොළේ බඩුවල මිල අඩුයි නේ.

2. 오늘은 야근을 해야 돼요. 일이 ____________________.
අද රෑ වැඩ කරන්න වෙනවා. වැඩ ගොඩක් තිබෙනවානේ.

정답 1) 싸거든요 2) 많거든요

## 대화 2 සංවාදය 2

Track 137



හඹං මහත්මිය හා සුපික මහත්මිය ගොවිපොළ අයිති නැන්දා සමග කතාකරමින් සිටි. මුලින්ම දෙබස සවන්දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

**주인 아주머니** 매일 치워도 이렇게 분뇨가 쌓이니까 치우기 너무 힘들지요?

හැමදාම අස්කරත් මේ විදිහට හැමදාම අපද්‍රව්‍ය එකතුවෙන නිසා ඉවත් කරන්න අපහසුයි නේද?

**흐엉** 좀 힘들기는 한데요. 그래도 하루라도 안 치우면 너무 지저분해지잖아요.

ටිකක් අපහසුයි. නමුත් එක දවසක් හෝ ඉවත් කලේ නැත්නම් ගොඩක් අපිළිවෙල වෙනවා නේ.

> **그래도** නමුත්
>
> · 일이 많아서 힘들어요. 그래도 행복해요.
> වැඩ වැඩි නිසා අපහසුයි. නමුත් සතුටින් ඉන්නවා.
>
> · 아침부터 머리가 많이 아팠어요. 그래도 일하러 나왔어요.
> උදේ සිට ඔලුව රිදුනා. නමුත් වැඩට පැමිණියා.

**수피카** 맞아요. 그런데 사모님, 어제 보니까 분뇨 버리는 곳에 다른 쓰레기도 많던데 따로 분리해서 버려야 하는 거 아니에요?

ඒක ඇත්ත. නමුත් නෝනා, ඊයේ බලන කොට සත්ව අපද්‍රව්‍ය දමන ස්ථානයේ වෙනත් අපද්‍රව්‍යයත් ගොඩක් තිබුනා. වෙනමම වෙන්කර ඉවත දැමිය යුතුයි නේද?

**주인 아주머니** 안 그래도 사장님이 폐기물 처리하는 것 때문에 시청에 가셨어요. 처리 방법이 좀 까다로워져서 교육 받고 오시면 말씀하실 거예요.

එසේ නොවුනත් ප්‍රධානියා අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්දයෙන් ඉගෙන ගැනීමට නගර ශාලාවට ගියා. ඉවතලන ආකාරය සංකීර්ණ නිසා ඉගෙනගෙන ඇවිල්ල කියල දේවි.

> **안 그래도** එහෙම නොකලත්
>
> · 먼저 전화하셨네요. 안 그래도 전화드리려고 했습니다.
> මුලින්ම ඇමතුවා නේද. එහෙම නොවුනත් අමතන්න කියල හිතාගෙන සිටියේ.
>
> · 가: 내일 백화점에 같이 갈래요?
> හෙට වෙළඳ සංකීර්ණයට යමු ද?
>
> 나: 안 그래도 가려고 했었는데 잘됐네요.
> එහෙම නොකලත් යන්න කියල තමා හිතාගෙන සිටියේ. හොඳයි.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


1. 사장님은 지금 어디에 가셨어요? ප්‍රධානියා දැන් කොහෙද ගියේ?
2. 분뇨는 얼마나 자주 치워요? සත්ව අපද්‍රව්‍ය කොපමණ කාලෙකට වරක් ඉවත් කරනවා ද?

**정답** 1. 시청에 가셨어요. 2. 분뇨는 매일 치워요.


### අලුත් වචන

처리하다 පිළියෙළ කරනවා　　분리하다 වෙන් කරනවා　　까다롭다 අපහසුයි


## 어휘 2 වචන මාලාව 2 폐기물과 정리 도구 අපද්‍රව්‍ය හා ඒවා ඉවත්කරන උපකරණ



අපද්‍රව්‍ය හා ඒවා ඉවත්කරන උපකරණ සම්බන්ධ කුමන වචන තිබේදැයි දැන ගනිමු?




폐기물
අපද්‍රව්‍ය




폐수
අපිරිසිදු ජලය



폐유
අපිරිසිදු තෙල්



분뇨/배설물
සත්ව අපද්‍රව්‍ය



환풍기
වෙන්ටිලේෂන් ෆෑන්




손수레
අත් කරත්තය




일륜차
විල්බරෝව




사다리
ඉණිමග



마대
රෙදි බෑග් / ගෝනි කවර



바구니
කූඩ






비닐 끈
ප්ලාස්ටික් නූල්



ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 그림을 보고 알맞은 말을 연결하세요. පින්තූරය දෙස බලා ගැලපෙන වචනය යාකරන්න.

①  ②  ③  ④  ⑤ 

㉠ 분뇨 ㉡ 사다리 ㉢ 폐수 ㉣ 환풍기 ㉤ 비닐 끈

정답 ① ㉢ ② ㉠ ③ ㉣ ④ ㉡ ⑤ ㉤

## 문법 2 සංවාදය 2 –아지다/어지다

G44-2

විශේෂණ පදය සමග සම්බන්ධ කොට යම් දෙයක හෝ පුද්ගලයෙකුගේ ස්වභාවයේ හෝ ස්වරූපයේ වෙනස්වීමක් ප්‍රකාශ කිරීමේදී භාවිතා කරයි.

| ㅏ, ㅗ → **–아지다** | ㅓ, ㅜ, ㅣ ආදී → **–어지다** | 하다 → **해지다** |
|---|---|---|
| 작다 → 작**아지다**<br>많다 → 많**아지다** | 크다 → 커**지다**<br>적다 → 적**어지다** | 조용하다 → 조용**해지다** |

· 가: 환풍기를 고치니까 어때요? වෙන්ටිලේටරය අලුත්වැඩියා කළ නිසා කොහොමද?
  나: 실내 공기가 훨씬 **깨끗해졌어요**. ඇතුළත වාතය ගොඩක් පිරිසිදු වුණා.
· 매일 아침 운동을 하니까 **건강해졌어요**. දිනපතා උදෑසන ව්‍යායාම කරන නිසා නිරෝගී වුණා.

විශේෂණ පදයකට '–아지다/어지다' එකතු වුවහොත් ක්‍රියා පදයක් බවට පත් වේ. ඒ අනුව '–고 있다' ව්‍යාකරණය සමග එකට ලියූවිට දිගටම ස්වභාවයේ හෝ ස්වරූපයේ වෙනස්වීමක් සිදුවෙමින් පවතිනවා යන්න දැක්විය හැකිය.

· 날씨가 점점 덥고 있어요. (X) 날씨가 점점 **더워지고 있어요**. (O)
  කාලගුණය එන්න එන්නම රස්නෙ වෙමින් තියෙනවා.
· 공장이 점점 깨끗하고 있어요. (X) 공장이 점점 **깨끗해지고 있어요**. (O)
  කර්මාන්තශාලාව එන්න එන්නම පිරිසිදු වෙමින් තියෙනවා.

### 대조적 정보 වෙනත් තොරතුරු

යමක ස්වභාවයේ වෙනස් වීමක් හටගන්නවා යන්න ප්‍රකාශ කිරීමේදී සිංහල භාෂාවෙහි 'ඊයේට වඩා අද රස්නෙයි.' වැනි සන්සන්දනාත්මක ප්‍රකාශනයන් යොදා ගන්නා නමුත් කොරියානු භාෂාවෙහි විශේෂණ ප්‍රකෘතියට '–아지다/어지다' සම්බන්ධ කර ප්‍රකාශ කරනු ලැබේ.

· 날씨가 (어제보다) **추워졌어요**. කාලගුණය (ඊයේට) වඩා සීතලයි.



'–아지다/어지다' අවබෝධ වුනා ද? එසේනම් '–아지다/어지다' යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

2. '–아지다/어지다'를 사용하여 문장을 완성하세요. '–아지다/어지다' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) 강물이 깨끗하다 → 강물이 더럽다

폐수 때문에 ______________________.

2) 동네가 조용하다 → 동네에 소음이 심하다

공사를 해서 ______________________.

3) 작업 환경이 나쁘다 → 작업 환경이 쾌적하다

정리 정돈을 잘 하니까 ______________________.



정답 1) 강물이 더러워졌어요 2) 동네에 소음이 심해졌어요 3) 작업 환경이 쾌적해졌어요

## 활동 ක්‍රියාකාරකම්

다음을 읽고 질문에 답하세요. පහත දැක්වෙන්න කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### 정리 정돈은 왜 해야 할까요?

පිළිවෙලට සකස්කළ යුත්තේ ඇයි?

1. 물건과 장소의 낭비를 줄일 수 있습니다.
   භාණ්ඩවල හා ස්ථානයේ නාස්තිය අඩුකරන්න පුළුවන්.
2. 안전사고를 예방할 수 있습니다. අවදානම් අවස්ථා වලින් වළකින්න පුළුවන්.
3. 기계를 오랫동안 잘 사용할 수 있습니다.
   උපකරණ දිගු කාලයක් භාවිතා කරන්න පුළුවන්.
4. 제품의 품질이 좋아집니다. භාණ්ඩයේ තත්වය හොඳ වෙනවා.
5. 생산 품종이 변경될 때 손실을 줄일 수 있습니다.
   නිෂ්පාදන ප්‍රභේද වෙනස්වනවිට සිදුවන පාඩුව අවම කරගත හැකිය.
6. 즐거운 직장, 발전하는 회사가 될 수 있습니다.
   සතුටු දායක රැකියා ස්ථානයක්, දියුණුවන සමාගමක් බවට පත් වෙන්න පුළුවන්.

1. 읽은 내용과 같으면 ㅇ 다르면 ×에 표시하세요.
   කියවූ අන්තර්ගතයට සමාන නම් ◯ එසේ නොවේනම් × ලකුණක් යොදන්න.

1) 정리를 잘하면 안전사고를 줄일 수 있습니다. ㅇ ×

2) 정리를 잘하면 기계를 빨리 바꿀 수 있습니다. ㅇ ×

3) 정리를 잘하면 회사에서 더 즐겁게 일할 수 있습니다. ㅇ ×

정답 1. 1) O 2) X 3) O

## 정보 තොරතුරු

# 작업 도구 정리 정돈

වැඩට ගන්නා උපකරණ පිළිවෙලට තැබීම



### 사용 목적에 따른 공구 정리
හාවිතා කරන අරමුණට අනුව උපකරණ පිළිවෙලට තැබීම

공구는 많은 종류가 있지만 본래의 목적 이외에 사용하는 것은 위험합니다. 알맞은 종류와 크기의 공구를 사용하기 쉬운 곳에 준비해 두세요.

මෙවලම් වර්ග ගොඩක් තිබුනත් එයට නියමිත වැඩයට අමතරව වෙනත් වැඩ වලට යොදා ගැනීම අනතුරුදායකයි. ගැලපෙන වර්ගය හා ප්‍රමාණයේ මෙවලම් භාවිතයට ගැනීමට පහසු ස්ථානයක සුදානම් කර තබන්න.

### 공구 점검 මෙවලම් පරික්ෂා කිරීම

공구는 항상 점검을 해야 합니다. 고장이 난 것은 폐기하거나 수리해서 사용해야 합니다.

මෙවලම් නිතරම පරික්ෂා කළ යුතුය. කැඩී ඇති ඒවා ඉවත්කර හෝ නැවත පිළිසකර කර භාවිතයට ගත යුතුය.





### 공구 사용 시 주변 정리 정돈
මෙවලම් භාවිත කරන විට අවට පිළිවෙලට තබාගත යුතුය

공구를 사용할 장소는 잘 정리되어 있어야 합니다. 공구에 손이나 발을 다치거나 공구가 떨어져서 다칠 수도 있습니다.

මෙවලම් භාවිතාකරන ස්ථානය හොඳින් පිළිවෙලට තබාගත යුතුය. මෙවලම් වල අතපය වැදීම හෝ මෙවලම් වැටි තුවාල වීමටද හැකිය.

### 보관 සුරක්ශිතව තබනවා

공구함을 준비하여 종류와 크기별로 공구를 구별하여 보관해야 합니다. 공구를 안전하고 쉽게 사용할 수 있습니다.

මෙවලම් පෙට්ටියක් සකස්කර වර්ගය හා ප්‍රමාණය අනුව වෙන්කර සුරක්ශිතව තැබිය යුතුය. මෙවලම් ආරක්ෂිතව හා පහසුවෙන් භාවිතා කළ හැකිය.



# EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK



අංක 1 හා 2 දෙබසට සවන් දී දෙබස හා සම්බන්ධ පිළිතුර තෝරන ප්‍රශ්න වේ. දෙබසට සවන්දීමට පෙර උදාහරණ දෙස බලන්න.

[1~2] 들은 것을 고르십시오. වෙනස් දෙය තෝරන්න.

Track 138


1. ① 폐유　　② 폐수
   ③ 폐기　　④ 폐물



2. ① 작업장이 깨끗해요.　　② 작업장을 치웠어요.
   ③ 작업장이 더러워요.　　④ 작업장을 정리해요.



අංක 3 හා 4 දෙබසට සවන් දී දෙබස හා ගැලපෙන පින්තූරය තෝරන ප්‍රශ්න වේ. අංක 5 පිරිමි පුද්ගලයාගේ දෙබසට සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන ප්‍රශ්නය වේ.

[3~4] 잘 듣고 내용과 관계있는 그림을 고르십시오.
හොඳින් සවන් දී අදහස හා සම්බන්ධයක් ඇති පින්තූරය තෝරන්න.

3. ①  ②  ③  ③ 

4. ①  ②  ③  ③ 

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන්න.

남자가 말한 정리 정돈의 효과로 맞지 않는 것을 고르십시오.
පිරිමි පුද්ගලයා පැවසූ මෙවලම් පිළිවෙලට තැබීමේ ප්‍රයෝජනයක් නොවන්නේ කුමක්ද.

① 품질이 떨어질 수 있어요.
② 안전사고를 예방할 수 있어요.
③ 물건의 낭비를 줄일 수 있어요.
④ 기계를 오래 사용할 수 있어요.



## 듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 폐수를 여기에 버리는 거예요? අපද්‍රව්‍ය මෙතන දමනවා ද?
   남: 네, 여기가 폐수를 버리는 곳이에요. ඔව්, මෙතන අපද්‍රව්‍ය ඉවත දමන ස්ථානයයි.
2. 여: 작업장이 더러워요. වැඩකරන තැන අපිරිසිදුයි.
   남: 그렇죠? 너무 지저분하네요. ඒක නමා? ගොඩක් අපිළිවෙලයි.
3. 남: 사다리가 있으면 올라갈 수 있겠네요. ඉනිමගක් තිබෙනවා නම් උඩට යන්න පුළුවන්.
   여: 사다리요? 저기에 있네요. ඉනිමගක්ද? මෙතන තියෙනවා.
4. 남: 지금 뭐 하고 있어요? දැන් මොනවද කරන්නේ?
   여: 냄새가 나서 환기하고 있어요. ගඳ නිසා වාතාශ්‍රය ලබාදෙනවා.
5. 남: 오늘 교육 시간에는 지난주에 이어서 작업장 정리가 왜 필요한지 설명하겠습니다. 우선 정리를 잘하면 안전사고를 예방할 수 있고, 물건의 낭비를 줄일 수 있어요. 그리고 제품을 잘 관리하니까 품질도 좋아지고요. 무엇보다 기계를 오랫동안 잘 사용할 수 있어요.

   අද ඉගෙන ගන්නා වෙලාවේදී පසුගිය පාඩමට අදාලව වැඩකරන තැන පිළිවෙලට තබාගත යුත්තේ ඇයි කියා විස්තර කරනවා. මුලින්ම පිළිවෙලට තිබෙනවා නම් අනතුරුවලින් වැළකී සිටීමට හැකි අතරි භාණ්ඩ අපතේ යාම වළක්වාලීමට හැකිය. තවද භාණ්ඩ හොඳින් හසුරවන නිසා ප්‍රමිතියත් ඉහල යනවා. මොනවටත් වඩා උපකරණ දීර්ඝ කාලයක් භාවිත කරන්න පුළුවන්.

정답 1. ② 2. ③ 3. ③ 4. ① 5. ①

## 확장 연습 තවදුරටත් වන අභ්‍යාස

L-44

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   남자가 사무실에 가는 이유는 무엇입니까? පිරිමි පුද්ගලයා කාර්යාලයට යන හේතුව කුමක්ද?

   ① 마스크를 잊어버려서　　② 작업장에 먼지가 많아서
   ③ 사무실에서 일해야 해서　　④ 귀마개를 안 가지고 와서

## 확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 바트 씨, 귀마개하고 마스크 가지고 왔지요?
   බාත් මහතා, ආරක්ශිත කන් ආවරණය සහ මුහුණු ආවරණය රැගෙන ආවාද?
   남: 오늘 작업은 먼지가 많이 난다고 해서 마스크만 가지고 왔는데요.
   අද වැඩ වල දූවිලි ගොඩක් වදින නිසා මුහුනු ආවරණයක් පමණක් රැගෙන ආවා.
   여: 여기는 소음이 심해서 귀마개를 꼭 착용해야 해요.
   මෙතන අධික ශබ්දය නිසා ආරක්ශිත කන් ආවරණය පැළඳිය යුතුයි.
   남: 몰랐어요. 사무실에 가서 얼른 가지고 올게요.
   දැනන් හිටියේ නැහැ. කාර්යාලයට ගිහින් ඉක්මනට අරන් එන්නම්.

정답 1. ④

# EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK



අංක 1 සිට 2 දක්වා ඇත්තේ පින්තූරය දෙස බලා ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ඉහත ඉගෙනගත් වචන මතක් කරගනිමින් පිළිතුරු සපයන්න.


[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1. 

① 손수레입니다. ② 배설물입니다.
③ 일륜차입니다. ④ 비닐 끈입니다.

2. 

① 냄새가 심해요. ② 소음이 심해요.
③ 공기가 쾌적해요. ④ 정리가 되어 있어요.



අංක 3 සිට 5 දක්වා ඇත්තේ හිස්තැනට ගැලපෙන වචනය තෝරන ප්‍රශ්න වේ. ඉගෙනගත් වචන මතක් කරගනිමින් පිළිතුරු සපයන්න.

[3~5] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오.
හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3. 가: 오늘은 작업장이 아주 쾌적하네요. අද වැඩපොළ හරිම ප්‍රසන්නයි.
나: 그렇죠? 청소를 ____________. එහෙමනේද? පිරිසිදු කළානේ.

① 하지요 ② 했거든요 ③ 하고 싶어요 ④ 할 거예요

4. 가: 며칠 전보다 분뇨가 ____________. දින කිහිපයකට පෙරට වඩා සත්ව අපද්‍රව්‍ය වැඩිවෙලා.
나: 그렇죠? 빨리 치워야겠어요. එහෙමද? ඉක්මනට ඉවත්කරන්න ඕනේ.

① 많아졌어요 ② 많으면 안 돼요
③ 많지 않을 거예요 ④ 많았으면 좋겠어요

5. 공구함을 준비하여 종류와 크기별로 공구를 구별하여 ____________ 해야 합니다.
මෙවලම් පෙට්ටිය සූදානම් කර වර්ගය හා ප්‍රමාණය අනුව අසුරා තැබිය යුතුය.
이렇게 잘 넣어 두면 공구를 안전하고 쉽게 사용할 수 있습니다.
මෙලෙස හොඳින් අසුරා තැබූ විට ආරක්ෂා සහිතව පහසුවෙන් භාවිතා කරන්න පුළුවන්.

① 사용 ② 보관 ③ 준비 ④ 점검

정답 1. ① 2. ② 3. ② 4. ① 5. ②



## 확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 새 작업 도구로 작업을 하니까 아주 편합니다. 전에 쓰던 것보다 ___________ 작고 가벼워서 좋습니다.

   නව වැඩ මෙවලම් වලින් වැඩ කිරීම ඉතා පහසුයි . පෙර භාවිතා කළ දෙයට වඩා ගොඩාක් කුඩා හා සැහැල්ලු නිසා එය හොඳයි.

   ① 혹시 ② 계속
   ③ 가장 ④ 훨씬

2. 작업장의 기계가 낡아서 새 기계로 바꾸었습니다. 새 기계로 ___________ 더 쉽고 편한 것 같습니다.

   වැඩ බිමේ යන්ත්‍රය පරණ නිසා නව යන්ත්‍රයකට මාරු කළා. නව යන්ත්‍රය සමග වැඩ කිරීම නිසා තවත් ලේසි සහ පහසු වේ.

   ① 작업하니까 ② 작업하든지
   ③ 작업하고자 ④ 작업하려고

3. 페인트 작업을 한 다음에는 바닥을 잘 닦아야 합니다. 그렇게 하지 않으면 사람들이 다니다가 ___________.

   පින්තාරු කරන වැඩය කළ පසුව ඊලඟට හොඳින් බිම පිසදැමිය යුතුයි. එසේ නොකරන්නේ නම්, මිනිසුන් යන එන විට ලිස්සා යා පුළුවන්.

   ① 찔리면 됩니다 ② 찔릴 수 있습니다
   ③ 미끄러지면 됩니다 ④ 미끄러질 수 있습니다

정답 1. ④ 2. ① 3. ④

## 발음 උච්චාරණය P-22

හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.

කොරියානු භාෂාවේ ව්‍යඤ්ජන දෙකක් පිළිවෙලින් යෙදෙන විට විවිධ ශබ්ද වෙනස්කම් සිදු වේ. නාසික්‍ය ශබ්ද ‘ㄴ’ සහ පුනර්වර්ති ‘ㄹ’ අක්ෂරය පිළිවෙලින් යෙදෙන අවස්ථාවේදී ‘ㄴ + ㄹ’, ‘ㄹ + ㄴ’ මේ දෙආකාරයෙන් කුමක් වුවත් වෙනසක් නොමැතිව [ㄹㄹ] ලෙස උච්චාරණය කෙරේ.

(1) 설날, 오늘날, 일 년
(2) 신라, 한라산, 천 리
(3) 컴퓨터는 아주 편리해요.
(4) 설날에는 떡국을 먹어요.